තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව



# කාර්යසාධන වාර්තාව

# 2023

© 2023 තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය
කොළඹ 01
ශ්‍රී ලංකාව

dgitm@itmd.treasury.gov.lk
http://www.treasury.gov.lk

# 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව

## තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය 329

## අන්තර්ගතය


- පරිච්ඡේදය **01 -** ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය
- පරිච්ඡේදය **02 -** ප්‍රගතිය හා ඉදිරි දැක්ම
- පරිච්ඡේදය **03 -** වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය
- පරිච්ඡේදය **04 -** කාර්යසාධන දර්ශක
- පරිච්ඡේදය **05 -** තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය
- පරිච්ඡේදය **06 -** මානව සම්පත් පැතිකඩ
- පරිච්ඡේදය **07 -** අනුකූලතා වාර්තාව

# 01 පරිච්ඡේදය
# ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. හැඳින්වීම

ජාතික ඩිජිටල් ආර්ථික ක්‍රමෝපායට (2023-2030) අනුකූල වෙමින් සැමට ඩිජිටල් අවස්ථාවන් සඳහා ප්‍රවේශය සහිත ප්‍රමුඛ පෙළේ ඩිජිටල් රාජ්‍යයක් බවට පත්වීමේ ඉලක්කය කරා ශ්‍රී ලංකාව ගමන් කරමින් සිටියි.

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන දෙපාර්තමේන්තුවක් ලෙස, ඩිජිටල් ආර්ථිකයක් කරා යන මාවතට පහසුකම් සැලසීමට තොරතුරු තාක්‍ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් මුල පිරිම් ගණනාවක් 2023 වර්ෂයේදී සිදු කරන ලදී.

- මහා භාණ්ඩාගාරයේ ඇතැම් කාර්ය ප්‍රවාහයන් ඩිජිටල්කරණය කිරීම මඟින් අනෙකුත් රාජ්‍ය ආයතන ලබා දෙන සේවාවන්හි විනිවිදභාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම
- අදාළ රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම සහ පද්ධති සංවර්ධනය, ඒකාබද්ධ කිරීම සහ දත්ත හුවමාරු කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම
- රාජ්‍ය ආයතන, සංවර්ධකයින්, පුරවැසියන් සහ සැපයුම්කරුවන්ගෙන් සමන්විත ඩිජිටල්කරණ පරිසරය ශක්තිමත් කිරීම
- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය මඟින් මහා භාණ්ඩාගාරය වෙත අඛණ්ඩව තොරතුරු තාක්ෂණ සේවා ලබා දීම

ඩිජිටල්කරණය වූ ආර්ථිකයක් කරා යන මාවතක් සඳහා සහායවීමට මහා භාණ්ඩාගාරයේ තොරතුරු තාක්‍ෂණ පහසුකම් සැපයීමටත් තීරණාත්මක පරිගණක පද්ධති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමටත් සේවා ස්ථාන සහයෝගීතා පොදු වේදිකාවන් වැඩිදියුණු කිරීමත් තොරතුරු තාක්‍ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

රටේ ආර්ථික සංවර්ධනය උදෙසා ඩිජිටල්කරණය කළ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම

### මෙහෙවර

භාණ්ඩාගාර කටයුතු නිසි කලට වේලාවට සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම පිණිස තීරණ ගැනීමට සහය වීම උදෙසා භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ඩිජිටල්කරණයට අවශ්‍ය පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය


### අරමුණු

- ඉ - රාජ්‍ය සංකල්පය සාක්ෂාත් කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- කඩදාසි භාවිතයෙන් තොර කාර්යාල පරිසරයක් නිර්මාණය සඳහා ඵලදායි ඩිජිටල් සන්නිවේදන ප්‍රවේශයකට අවතීර්ණ වීම
- කාර්යක්ෂම සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික පද්ධති සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා පද්ධති සංවර්ධනය කිරීම
- මහා භාණ්ඩාගාරයේ තොරතුරු තාක්ෂණ පද්ධති මඟින් බාධාවකින් තොරව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ලබා දීම සහතික කිරීම සඳහා මූලික යටිතල පහසුකම් නවීකරණය කිරීම
- අමාත්‍යාංශයේ වෙබ් ද්වාරය සහ වෙනත් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්‍රම හරහා පුරවැසියන්ට අවශ්‍ය තොරතුරු බෙදා හැරීමට සහතික කිරීම

## 1.3. ප්‍රධාන කාර්යයන්

- මුදල් අමාත්‍යාංශයට සහ එහි දෙපාර්තමේන්තු සඳහා සම්මත තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයන් පිළිබඳ කාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීමට කටයුතු කිරීම
- ක්‍රියාවලිවල නිසි ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම සඳහා තොරතුරු තාක්ෂණ පද්ධති සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම
- ජාතික මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික මුලපිරීම් සඳහා පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීම සහ ව්‍යාපෘති ජීවන චක්‍රය පුරාවට අවශ්‍ය පහසුකම් සැලසීම
- සයිබර් ආරක්ෂාව සහතික කිරීම
- භාණ්ඩාගාර වෙබ් අඩවිය ඔස්සේ යාවත්කාලීන කළ තොරතුරු සැපයීම
- නියමිත කාලවලදී තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් දියුණු කිරීම
- තොරතුරු සන්නිවේදන තාක්ෂණික සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමට අවශ්‍ය නඩත්තු කටයුතු සිදු කිරීම
- තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත තාක්ෂණික පුහුණු අවස්ථා ලබා දීම.

## 1.4. සංවිධාන සටහන




| | | | |
|---|---|---|---|
| ADG | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | DO | සංවර්ධන නිලධාරී |
| DD | නියෝජ්‍ය අධ්‍යක්ෂ | ICTA | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර |
| AD | සහකාර අධ්‍යක්‍ෂ | MSO | කළමනාකරණ සේවා නිලධාරී |
| AO | පරිපාලන නිලධාරී | KKS | කාර්යාල කාර්ය සහයක |
| ICTO | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | | |

## 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය
- තොරතුරු තාක්ෂණ අංශය
- පාලන සහ ගිණුම් අංශය

## 1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල් - නැත

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - අදාල නැත

# 02 පරිච්ඡේදය
## ප්‍රගතිය සහ අනාගත දැක්ම


තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව, ආර්ථික ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී සහ විශේෂයෙන් ඩිජිටල් ආර්ථිකයක් කරා යාමේදී රජයට සහාය වීම සඳහා භාණ්ඩාගාර කළමනාකරණ ඩිජිටල්කරණය සම්බන්ධීකරණය කිරීම සහ පහසුකම් සැලසීම පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි.

### 2.1 2023 වර්ෂයේදී ලබා ගත් විශේෂ ජයග්‍රහණ

- මුදල් අමාත්‍යාංශය සඳහා Endpoint Security System සාර්ථකව ක්‍රියාත්මක කිරීම.
- ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය (NOC), දත්ත මධ්‍යස්ථානය (DC) සහ ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථාන (DR) සඳහා Veeam උපස්ථ විසඳුම් සාර්ථකව ස්ථාපනය කර ඇති අතර යෙදුම් අවශ්‍යතාවයන්ට අනුව දැනට වින්‍යාස කරමින් පවතී.
- ඉ - වැටුප් ගෙවීමේ පද්ධතිය මාර්ගගතව භාවිතා කිරීමට ලංකා රාජ්‍ය මේසය (LGC) හි ස්ථාපනය කළ අතර පද්ධතියේ මෙහෙයුම් හා නඩත්තු (O&M) ගිවිසුම් අදාළ පාර්ශ්ව සමඟ අත්සන් කිරීම.
- කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ ඉල්ලීම මත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියේ (*Non-Financial Asset Management System*) පළමු අදියර (වාහන වත්කම් මොඩියුලය) සංවර්ධනය කිරීම.
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත ඒ සඳහා කාර්ය මණ්ඩල කළමනාකරණ පද්ධතිය (*Carder Management System*) සංවර්ධනය කිරීමේ මූලික අධ්‍යයනයන් ආරම්භ කිරීම.
- භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත ඒ සඳහා දේපල ණය ඇපකර අරමුදල් පියවීම් අධීක්ෂණ පද්ධතිය (*Property Loan Guarantee Fund Settlement Monitoring System*) සංවර්ධනය කිරීම ආරම්භ කිරීම.
- මුදල් අමාත්‍යාංශයේ වෙබ් ද්වාරය සංවර්ධනය කිරීම සම්පූර්ණ කිරීම.

## තොරතුරු තාක්ෂණය සම්බන්ධ ගැටලු විසඳීම - 2023.01.01 සිට 2023.12.31 දක්වා

2023 වර්ෂය තුළදී තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශයේ විවිධ තොරතුරු තාක්ෂණ ගැටළු පහත දක්වා ඇති පරිදි විසඳා ඇත.




*මූලාශ්‍රය: තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව*

## 2.2 අනාගත ක්‍රියාකාරකම්

මුදල් අමාත්‍යාංශයේ ඩිජිටල් ක්‍රියාකාරකම් ඉටු කිරීමේ වාතාවරණයක් ඇති කිරීම සඳහා අනාගතයේදී පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත.

- ඩිජිටල් භාණ්ඩාගාර කළමනාකරණය සඳහා පහසුකම් සැපයීම
- මුදල් අමාත්‍යාංශය සඳහා අවශ්‍ය තාක්‍ෂණික සහාය ලබා දීම
- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) ආයතනයේ සහාය ඇතිව සයිබර් ආරක්ෂණ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම
- කාර්ය මණ්ඩලයට අවශ්‍ය තොරතුරු තාක්‍ෂණ දැනුම හා කුසලතා ලබා දීම
- මුදල් අමාත්‍යාංශය සඳහා හවුල් විසඳුම් පහසුකම් (Shared Solutions Facilities) වැඩිදියුණු කිරීම
- ඉ - වැටුප් ගෙවීමේ පද්ධතිය සජීවී ධාවනය සඳහා අවශ්‍ය සහාය සේවා සැපයීම
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ඉල්ලීම අනුව ඒ සඳහා සේවක කළමනාකරණ පද්ධතියක් (*Carder Management System*) සංවර්ධනය කර අවසන් කිරීම
- දේපළ ඇපකර අරමුදල් පියවීම් අධීක්‍ෂණ පද්ධතිය (*Property Loan Guarantee Fund Settlement Monitoring System*) සංවර්ධනය කර අවසන් කිරීම
- රාජ්‍ය අංශයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ තොරතුරු පද්ධතියේ (*Non-Financial Assets Management System*) පළමු අදියර සම්පූර්ණ කර ක්‍රියාත්මක කිරීම සහ සජීවී ධාවනය සඳහා පද්ධතිය දියත් කිරීම.
- මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියේ ව්‍යුහ සහ ගොඩනැගිලි වත්කම් මොඩියුලය ආරම්භ කිරීම
- තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම
- තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ කාර්ය මණ්ඩලයේ කුසලතා ඉහළ නැංවීමට සහ වැඩි දියුණු කිරීම සඳහා දේශන, වෙබිනාර් සැසි, ක්ෂේත්‍ර චාරිකා, ප්‍රායෝගික වැඩමුළු ආදිය ඇතුලත් අඛණ්ඩ ඉගෙනුම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම
- 2024 අයවැයෙහි දක්වා ඇති පරිදි 2030 වන විට ඩිජිටල් ආර්ථිකයක් සාක්‍ෂාත් කර ගැනීම ඉලක්ක කර ගනිමින් රජයේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් අනෙකුත් අදාළ අයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම

……………………

කේ. රවීන්ද්‍ර පත්මප්‍රිය

අධ්‍යක්‍ෂ ජනරාල්

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

කේ. රවීන්ද්‍ර පත්මප්‍රිය
අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු තාක්‍ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

# 03 පරිච්ඡේදය

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2023 රු. | | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | - | |
| - | ආදායම් බදු | 1 | | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 440,555,000 | 211,489,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 11,641,679 | 458,334 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 3,187,454 | 3,309,741 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 1,972,131 | 1,966,693 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **457,356,264** | 217,223,768 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **457,356,264** | 217,223,768 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **5,071** | 235,740 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 457,351,193 | 216,988,028 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 49,800,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 41,399,909 | 41,269,571 | |
| 767,705,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 387,865,296 | 170,810,415 | ඒසීඒ-2(ii) |
| 418,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 417,778 | 243,464 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| - | පොළී ගෙවීම් | **8** | | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | | - | |
| 817,923,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **429,682,984** | 212,323,450 | |
| | **මූලධන වියදම්** | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | - | - | **ඒසීඒ-2(ii)** |
| 9,470,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 8,844,837 | 1,284,960 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 500,000 | හැකියා වර්ධනය | **14** | 486,250 | 188,026 | |
| - | වෙනත් මූලධන වියදම් | **15** | - | - | |
| 9,970,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **9,331,087** | 1,472,986 | |
| | තැන්පතු ගෙවීම් | | 11,955,674 | 67,400 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 2,966,596 | 3,265,782 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 14,922,271 | 3,333,182 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 453,936,342 | 217,129,618 | |
| 827,893,000 | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | 3,414,851 | (141,590) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | 3,414,851 | (141,590) | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | | **ඒසීඒ-3** |
| | | | - | - | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 53,829,390.70 | 48,006,966.92 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 6,545,797.30 | 6,766,654.59 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | | - |
| **මුළු වත්කම්** | | **60,375,188.00** | **54,773,621.51** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 6,141,076.52 | 6,047,938.06 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | ඒසීඒ-6 | 53,829,390.70 | 48,006,966.92 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 404,720.78 | 718,716.53 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | | |
| **මුළු වගකීම්** | | **60,375,188.00** | **54,773,621.51** |

පිටු අංක...06...සිට ..16... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..17.... සිට ..22.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................ | ............................ | ............................................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 23/02/24 | දිනය : 21/02/2024 | දිනය : 21/02/2024 |

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

කේ. රවීන්ද්‍ර පත්මප්‍රිය
අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

D. P. Gnanendra Pradeep
Director (Finance)
Department of Information Technology Management
Ministry of Finance, Economic Stabilization and National Policies
The Secretariat, Colombo 01.

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සතය | |
|---|---|---|
| | **2023**<br>රු. | **2022**<br>රු. |
| <u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 1,972,131 | 1,966,694 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | - |
| අග්‍රිම ලැබීම් | 440,555,000 | 211,489,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 1,866,397 | 2,231,938 |
| තැන්පතු ලැබීම් | 11,641,679 | 458,335 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **456,035,207** | **216,145,967** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 41,252,534 | 41,165,211 |
| සහනාධාර සහ මාරුකිරීම් | 417,778 | 243,464 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | **5,071** | 235,741 |
| අත්තිකාරම් ගෙවීම් | 730,138.47 | 2,150,750 |
| තැන්පතු ගෙවීම් | 11,955,674 | 67,400 |
| වෙනත් ප්‍රධාන ලෙජර් වියදම් | 392,342,923 | 170,810,415 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **446,704,120** | **214,672,981** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **9,331,087** | **1,472,986** |
| <u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| පොළී | - | - |

| | | |
|---|---|---|
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |
| | | |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| මූලධන වියදම් | 9,331,087 | 1,472,986 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **9,331,087** | **1,472,986** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(9,331,087)** | **(1,472,986)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **0** | **-** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| | | |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තා කිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

   2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

   මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

   මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

   හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

   වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

   දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

   මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

   2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

   * යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

   * තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | අදාල නොවේ | | | | |

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම * | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 825,893 | 817,923 | 429,683 | 52.53 |
| ප්‍රාග්ධන | 2,000 | 9,970 | 9,331 | 93.59 |

### 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | | | අදාල නොවේ | | | |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 43,763 | 43,763 | - | 100 |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 2,667 | 2,667 | - | 100 |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපති විසින් නිකුත් කරනු ලැබූ 2023 දෙසැම්බර් 31 වන දිනට නියමිත අවසන් විගණන වාර්තාව ඇමුණුම 01 හි අමුණා ඇත.

# 04 පරිච්ඡේදය
# කාර්යසාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 75%-89% | 50%-74% |
| 1 | මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්‍ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, නඩත්තු කිරීම සහ අධීක්ෂණය කිරීම | 100 | | |
| 2 | මුදල් අමාත්‍යාංශයේ දෘඩාංග නඩත්තු කිරීම | 100 | | |
| 3 | විද්‍යුත් වැටුප් ගෙවීමේ පද්ධතිය පුළුල් කිරීම - යටිතල පහසුකම් නඩත්තුව | 100 | | |
| 4 | MoF වෙබ් ද්වාරයේ අන්තර්ගත යාවත්කාලීන කිරීම | 100 | | |
| 5 | MoF වෙබ් ද්වාරය සඳහා වැඩි දියුණු කිරීම් කිරීම | 100 | | |
| 6 | භාණ්ඩාගාර අන්ත : ජාලය අධීක්ෂණය සහ නඩත්තු කිරීම | 100 | | |
| 7 | කාර්යක්ෂම නිල සන්නිවේදනය සඳහා විද්‍යුත් තැපැල් පද්ධතිය (Outlook) සම්බන්ධීකරණය කිරීම | 100 | | |
| 8 | පද්ධති සංවර්ධනය/ පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම | 95 | | |
| 9 | නිලධාරීන්ට සහ අභ්‍යාසලාභී පුහුණුවන්නන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම/ කළමනාකරණය කිරීම | 100 | | |

## 05 පරිච්ඡේදය
## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%- 100% |
| 08. සියල්ල ඇතුලත් සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායි රැකියා නියුක්තිය සහ සෑමට මනා කාර්ය භාරයක් ප්‍රවර්ධනය කිරිම | නවීන ක්‍රමවේද තොරතුරු තාක්ෂණ සන්නිවේදන භාවිතා කරමින් එක් එක් දෙපාර්තමේන්තුවේ ස්වයංක්‍රිය පද්ධති සහ කාර්ය පටිපාටින් ක්‍රියාත්මක කිරිම සහතික කිරිම | පද්ධති සංවර්ධනය කිරිම<br><br>අභ්‍යන්තර තැපැල් පද්ධතිය ප්‍රවර්ධනය (Outlook ) | | | 95 %<br><br>100% |
| | භාණ්ඩාගාරයේ ආර්ථික, මූල්‍ය, ආයතනික යනාදී තොරතුරු පහසුවෙන් රාජ්‍ය ආයතනවලට හා පොදු මහජනතාවට ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසීම | මහා භාණ්ඩාගාර වෙබ් අඩවිය යාවත්කාලින කිරීම<br><br>භාණ්ඩාගාරයේ අන්ත:ජාලය යාවත්කාලින කිරීම | | | 100 %<br><br>100% |
| 09. නවමු යටිතල පහසුකම් ගොඩ නැංවීම, සියල්ල ඇතුළත් තිරසාර කාර්මිකරණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම | ඉ - රාජ්‍ය අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අනෙකුත් දෙපාර්තමේන්තුවල තොරතුරු තාක්ෂණ සන්නිවේදන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම | තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් නඩත්තුව<br><br>තොරතුරු තාක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | | | 100 %<br><br>100 % |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

මහා භාණ්ඩාගාරයේ / මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු වල ස්වයංක්‍රීයකරණ කටයුතු සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව වගකීම දරයි. ඒ අනුව, 2023 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව විසින් ඉහත 5.1 ඡේදයේ හඳුනාගෙන ඇති තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් කිහිපයක් පහත දක්වා ඇත.

- ගුණාත්මක, ඵලදායි හා කාර්යක්ෂම සන්නිවේදන පද්ධතියක් සහතික කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ජාල යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම
- මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියේ පළමු අදියර (වාහන වත්කම් මොඩියුලය) ක්‍රියාත්මක කිරීම.
- රජයේ සේවකයින්ට කාර්යක්ෂමව හා ඵලදායි ලෙස වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ / මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු තුළ ඉ-වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කර වසරක කාලයක් සඳහා සේවා සහ නඩත්තු ගිවිසුමතට එළඹීම.
- රාජ්‍ය / පෞද්ගලික ආයතන මෙන්ම සාමාන්‍ය ජනතාව සමඟ නිසි සන්නිවේදනය හා අන්තර් ක්‍රියාකාරිත්වය සඳහා අමාත්‍යාංශ වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම
- භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සාර්ථකව පැවැත්වීම

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී දෙපාර්තමේන්තුව පහත අභියෝගවලට මුහුණ දී ඇත.

- ඉ-සේවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන දක්ෂතාවයන් හා කුසලතාවයන්ගෙන් හෙබි තාක්ෂණික කාර්ය මණ්ඩලයේ (ද්විතියික සහ තෘතීයික මට්ටම) හිඟය
- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ නඩත්තුව සඳහා ඉහළ පිරිවැයක් වැය වීම
- ආයතනික පුහුණු අවස්ථා නොමැති වීම සහ තොරතුරු තාක්‍ෂණ සංවර්ධන කටයුතු කිරීමට සුදුසු පරිසරයක් නොමැති වීම.
- පර්යේෂණ සහ සංවර්ධන පහසුකම් නොමැතිවීම
- ඇතැම් ක්ෂේත්‍ර සඳහා ජාතික මට්ටමේ තොරතුරු තාක්‍ෂණ පද්ධති විධිවිධාන නොමැති වීම

# 06 පරිච්ඡේදය
# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | 17 | 14 | 03 |
| **තෘතියික** | 14 | 10* | 04 |
| **ද්විතියික** | 34 | 23 | 11 |
| **ප්‍රාථමික** | 08 | 07 | 01 |
| **එකතුව** | **73** | **54** | **19** |

*නිලධාරීන් දෙදෙනෙක් (02) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව දේශීය හා විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත.

## 6.2 ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

මුදල් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සඳහා කාර්යක්ෂම හා නවීන තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීම තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව සතු කාර්යභාරය වේ. එම කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා පද්ධති සංවර්ධනය, ජාල පරිපාලනය, දත්ත සමුදාය කළමනාකරණය වැනි අත්‍යවශ්‍ය කුසලතා ඇති කාර්ය මණ්ඩලයක් මෙන්ම සේවාදායක නඩත්තු කිරීම, සයිබර් ආරක්ෂාව, ජාල ආරක්ෂාව, ජංගම යෙදවුම් මෘදුකාංග සංවර්ධනය, ගුණාත්මක බව සහතික කිරීම ආදී ක්ෂේත්‍රයන්හි මනා දැනුමක් ඇති කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වේ.

එම අවශ්‍යතාවයන් සපුරා ලීම සඳහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කිහිපයක පැවති තොරතුරු තාක්ෂණ තනතුරු මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ගැනීමට අනුමැතිය ලබා ගෙන ඇති අතර, පැවති පුරප්පාඩුවලින් පුරප්පාඩු 07 ක් 2023 වසර අවසානය වන විට සම්පූර්ණ කර ගැනීමට හැකි වී ඇත. නමුත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් මෙම දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු කර ගැනීමේදී සුදුසු අනුප්‍රාප්තිකයන් සහිතව පමණක් නිදහස් කිරීමට අදාළ ආයතනවල එකඟතාවය ලබා දෙන බැවින්ද රජයේ වියදම් කළමනාකරණය හේතුවෙන් රජයේ සේවයට නව බඳවා ගැනීම් සීමා කර ඇති බැවින් ද එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම දුෂ්කර වී තිබේ.

එසේ වුවද, ප්‍රායෝගික පුහුණුව සඳහා උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලින් බඳවා ගනු ලබන අභ්‍යාසලාභීන්ගේ ද සහාය ඇතිව කාර්යක්ෂම සේවාවක් සැපයීමට දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | Refresher Boot Camp වැඩසටහන (IT) - ICTA | 03 | දින 03 | - | - | දේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 2 | කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 38 | දින 01 | - | - | දේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 3 | මුදල් රෙගුලාසි | 16 | දින 01 | - | - | දේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 4 | තොරතුරු ආරක්ෂණ නිලධාරීන් (ISOs) සහ සහකාර තොරතුරු ආරක්ෂක නිලධාරීන් (AISOs) (IT) සඳහා සයිබර් ආරක්ෂණ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන | 02 | දින 01 | - | - | දේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 5 | කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | 20 | දින 01 | - | - | දේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 6 | රාජකාරි ලිවීම් පිළිබඳ වැඩමුළුව | 05 | දින 03 | - | - | දේශීය | රාජකාරී ලිපි ලිවීම සම්බන්ධ විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 7 | ඉ - ප්‍රසම්පාදන පුහුණු පාඨමාලාව | 07 | දින 01 | - | - | දේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 8 | ප්‍රධාන අභ්‍යන්තර විගණකයේ කාර්තුමය ඇගයීම් වාර්තාව සකස් කර ගැනීමට අදාළව Google Form සකස් කිරීම | 09 | දින 01 | - | - | දේශීය | Google Form සකස් කිරීම සම්බන්ධ දැනුම වර්ධනය කර ගැනීම |
| 9 | සයිබර් ආරක්ෂණ ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන (CERT) | 08 | දින 01 | - | - | දේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 10 | රාජකාරි ලිපි ලිවීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 25 | දින 01 | - | - | දේශීය | රාජකාරී ලිපි ලිවීම සම්බන්ධ දැනුම වර්ධනය කර ගැනීම |
| 11 | Citra Fellowship විධායක වැඩසටහන | 01 | දින 05 | - | - | දේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 12 | “Microsoft Azure” වැඩසටහන | 04 | මාර්ගගත0 | 108,000 | | දේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 13 | ජාල ආරක්ෂාව සහ DDOS වැළැක්වීම | 07 | දින 01 | - | - | දේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 14 | ගිණුම් ලිපිකරු පුහුණු වැඩසටහන | 02 | දින 02 | 19,000 | | දේශීය | මුදල් රෙගුලාසි සම්බන්ධධ විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 15 | සයිබර් ආරක්ෂණ ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන | 02 | දින 03 | - | - | දේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 16 | 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සම්බන්ධ පුහුණු වැඩමුළුව | 55 | දින 02 | 359,250 | - | දේශීය | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සම්බන්ධ අවබෝධයක් ලබා ගැනීම |
| 17 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඩිජිටල් රජයක් ගොඩනැගීම පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 01 | දින 14 | - | - | විදේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 18 | IOT ඩිජිටල් යෙදුම් සමඟ ජාලකරණ තාක්ෂණය පිළිබඳ පුහුණුව - මැලේසියාව | 01 | දින 14 | - | - | විදේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 19 | 5G ජංගම සන්නිවේදන තාක්ෂණය සහ යෙදුම් පිළිබඳ උසස් සම්මන්ත්‍රණය - චීනය | 01 | දින 14 | - | - | විදේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |
| 20 | ගෝලීය සංවර්ධන මුලපිරීම යටතේ යටිතල පහසුකම් සම්බන්ධතාවය සහ සහයෝගීතාව පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 01 | දින 14 | - | - | විදේශීය | විෂය දැනුම වර්ධනය කර ගැනීම |

# 07 පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අදාළ නැත | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අදාළ නැත | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අදාළ නැත | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාළ නැත | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | - | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | - | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | - | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TPD/E/DITM/2/23/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 මැයි 28 දින

ගණන්දීමේ නිලධාරී

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

**ශීර්ෂය - 329 තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය - 329 තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

භාණ්ඩාගාර අග්‍රිම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් තොරතුරු අනුව 2023 වර්ෂය සඳහා සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිම එකතුව රු.මිලිය 831.95 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.මිලියන 1,407.36 ක් ඉල්ලුම්කර තිබුණි. එහෙත් 2023 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 440.40 ක් පමණක් ලැබී තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

### 2.2 වියදම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) වැය විෂයයන් 06 ක් සඳහා මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.2,964,000 ක් ප්‍රමාණවත් නොවීම නිසා මු.රෙ.66 මඟින් රු.9,122,300 ක් එනම්, මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 5 සිට සියයට 720 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 03 ක් සඳහා මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.983,705,000 කින් රු.10,768,300 ක ප්‍රමාණයක් ප්‍රතිපාදන අඩුකර වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඇ) වැය විෂයය අංක 329-1-1-0-1408-0/11 - මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සලසා නොගෙන මුදල් රෙගුලාසි 66 මඟින් මාරුකර ගැනීම තුළින් රු.1,646,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

(ඈ) සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට වැය විෂයයන් 11 ක් සඳහා 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු.824,905,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.388,451,690 ක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී පැවතුණි. එය එම වැය විෂයයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට සියයට 67 ක සැලකිය යුතු පරාසයක් ගෙන තිබුණි.

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

ITMIS ව්‍යාපෘතියේ මෙහෙයුම් හා නඩත්තු වෙනුවෙන් පසුගිය වර්ෂ 3ක කාර්තු 5 ක් වෙනුවෙන් ගෙවීමට හිඟව තිබූ රු.102,228,904 ක මුදලක් 2024 පෙබරවාරි 15 දින ගෙවා තිබුණි. එහෙත් එම වටිනාකම් 2023 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි, බැරකම් ලෙස දක්වා නොතිබුණි.

## 2.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

නිලධාරින් සඳහා අත්තිකාරම් බී ගිණුම යටතේ ණය ලබා දිමේදී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 14:11 වගන්තියට අනුව 23 වැනි පරිශිෂ්ටයේ දක්වා ඇති විශ්‍රාම වැටුප පරිවර්තනය කිරීම සඳහා දෙනු ලබන අවලංගු කළ නොහැකි පොරොන්දු ප්‍රකාශයක් ලබා ගත යුතු වුවත්, සාමලෝචිත වර්ෂය තුල නිලධාරීන් 11දෙනෙකු සඳහා එකතුව රු.626,888 ක ආපදා ණය ලබාදිමේදී ඉහත ප්‍රකාශය ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2023 දෙසැම්බර් 30 දිනැති අංක 5/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.7 ඡේදය | (i) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අත්තිකාරම් අයකර ගැනීම් රු.4,457,102 ක් වුවත් එය රු.1,866,397 ක් ලෙස දක්වා තිබුණි.<br><br>(ii) අත්තිකාරම් ගෙවීම් වෙනුවෙන් වැය කරන ලද මුදල රු.3,320,843 ක් වුවද එය රු.730,138 ක් ලෙස මුදල් ප්‍රවාහයේ දක්වා තිබුණි.<br><br>(iii) මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම රු.429,117,831 ක් වුවද, එය රු.41,252,534 ක් ලෙස දක්වා තිබුණු අතර වෙනත් ප්‍රධාන ලෙජර් |

රු.41,252,534 ක් ලෙස දක්වා තිබුණු අතර වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් වියදම් රු.392,342,923 ක් මුදල් වැය කිරීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වරදවා දක්වා තිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තුව විසින් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද රු.4,477,627 ක වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.2 ප්‍රසම්පාදනයන්

රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව මිල සැඳහුම් ක්‍රමයට ප්‍රසම්පාදන කිරීමේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කළ යුතු බව දක්වා තිබුණ ද දෙපාර්තමේන්තුව විසින් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර 2023 වර්ෂයේදී අවස්ථා 15 දී එකතුව රු.8,636,897 ක් වූ ප්‍රසම්පාදන අයිතමයන් මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් ද තෘතියික මටට්ටමේ තනතුරු 04 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 09 ලෙස අනුමත තනතුරු සංඛ්‍යාව 16 කින් වැඩිකර ගෙන තිබුණි.ඒ අනුව දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 73 ක් වූ අතර, ඉන් තනතුරු 21 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ අතුරින් ජ්‍යෙෂ්ඨ මට්ටම තනතුරු 03 ක් ද තෘතියික මටට්ටමේ තනතුරු 06 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 11 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක් ද විය.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට